# වෙනම ළමා අධිකරණයක්

**විජයානි එදිරිසිංහ**

ළමා වැරදිවලට හසුවන දරුවන් වෙනුවෙන් වෙනම ළමා අධිකරණයක් සහ රැඳවුම් ස්ථානයක් ඉදිකිරීමට අධිකරණ අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

ළමා වැරදි සහ ඔවුන් රඳවා තැබීම සම්බන්ධව සොයා බැලීම සඳහා පත්කර තිබූ කමිටුවේ සභාපතිනි ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ශිරානි තිලකවර්ධන මහත්මියගේ වාර්තාවට අනුව ළමා වැරදිකරුවන් වෙනුවෙන් එම පියවර ගෙන තිබේ.

මෙතෙක් කාලයක් ළමා වැරදිකරුවන්ට අදාළ චෝදනා විභාග වූයේ පොදු අධිකරණවලදීය. වැරදිකරුවන් වන ළමුන් රඳවා තැබුවේද වැඩිහිටි වැරදිකරුවන් සිටින සිර කඳවුරුවලය.

එම තත්ත්වය ළමුන්ගේ මානසික තත්ත්වයට සහ යහ පැවැත්මට අහිතකර බව ශිරානි තිලකවර්ධන විනිසුරුවරිය එම වාර්තාවෙන් පෙන්වා දී තිබුණි.

එම වාර්තාවේ තිබූ කරුණු සැළකිල්ලට ගනිමින් අධිකරණ ඇමැති මිලින්ද මොරගොඩ මහතා විසින් වහාම ළමා අධිකරණයක් සහ රැඳවුම් ස්ථානයක් පිහිටුවීමට පියවර ගෙන ඇත. එම ළමා අධිකරණය කොළඹ අලුත්කඩේ උසාවි සංකීර්ණ භූමියේ මේ වනවිටත් ඉදිකරගෙන යයි. ළමා රැඳවුම් ස්ථානය අඹේපුස්ස ප්‍රදේශයේ තිබූ ගොඩනැගිල්ලක ආරම්භ කර ඇත.

මීට පෙර ළමා අධිකරණයක් මෙරට නොපැවති අතර එවැනි අධිකරණයක් පිහිටුවන ප්‍රථම අවස්ථාව මෙය වෙයි. ඉදිරි මාස තුන ඇතුළත එහි වැඩකටයුතු අවසන් කර එයින් අවුරුදු 16ට අඩු වැරදිවලට අදාළ චෝදනා එහිදී විභාග කිරීමට තීරණය කර තිබේ.